*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2011, [illegible]වැනි කලාපය, පිටු 121-134*
*ISSN 1800-1459*

# ඉන්දියානු රාජ පදවි ප්‍රාප්ත ක්‍රමයේ සම්ප්‍රාප්තිය, හා පැරණි ලංකාවේ දේශපාලන හා පරිපාලන තන්ත්‍රය සකස් වීම පිළිබඳ විමර්ශනයක්

**එච්.එම්. සමන් බන්දු හේරත්**

*ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*

## සාරාංශය

ක්‍රි. පූ. තුන්වන සියවස යනු ඉන්දියාවේ බලපෑමත් සමඟ දේශපාලන ක්ෂේත්‍රයේ පමණක් නොව ආගමික, සංස්කෘතික, ආර්ථික හා සාමාජීය ආදී ක්ෂේත්‍ර ගණනාවක ම පුළුල් වෙනස් වීමකට බඳුන් වූ යුගයකි. මෙම සියවසේ ලක්දිව වැදගත් ම රජු වූයේ දේවානම්පිය තිස්ස රජු ය. මොහු නව දේශපාලන ක්‍රමවේදයක් මෙරට ගොඩනැංවීම සඳහා මුල් වී ක්‍රියා කළ පුද්ගලයා යි. දෙවරක් අභිෂේක ලැබූ ලක්දිව ප්‍රථම රජු වන්නේ දේවානම්පිය තිස්ස රජු ය. මොහු ඉන්දියානු අභිෂේකය ලබන්නට පෙර මෙරට ඒ වන විට පැවති ක්‍රමවේදය අනුගමනය කරමින් අභිෂේක ලැබීය. දෙවන වර අශෝක අධිරාජයාගෙන් ලැබුණු ක්‍රමවේදය හරහා නැවත අභිෂේකයක් සිදුකරමින් රාජ්‍යත්වයට පත් වූ අතර ඉන් අනතුරුව, රජ පදවිය පත්වීම හා පරිපාලන ක්‍රමවේදය ආක්‍රමණ ඇති වූ කාල වකවානුවලදී සුළු වශයෙන් වෙනස්වීම්වලට ලක් වූව ද මූලික වශයෙන් ඉන්දියානු අභිෂේක ක්‍රමය අනුගමනය කරමින් ඉදිරියට ගමන් කරනු දක්නට ලැබේ. දේවානම්පිය තිස්ස රජුගේ අභිෂේකයේ පටන් ආරම්භ වූ අභිෂේක ක්‍රමවේදය ක්‍රමයෙන් හිංදු ආගමික බලපෑම්වලින් මිදී බෞද්ධ ආගමික ලක්ෂණ සමඟ මුසුවෙමින් ඉදිරියට ගමන් කළ අතර පරිපාලන ක්ෂත්‍රයේ පෙර නොවූ විරූ ආකාරයේ නිලතල හා වගකීම් සමුදායක් සහිත ව විධිමත් රාජ්‍ය පාලන ක්‍රමවේදයක් සංවර්ධනය වුණි.

කේන්ද්‍රීය වචන - අභිෂේකය, රාජ්‍යත්වය, පරිපාලන තන්ත්‍රය, ඉන්දියානු බලපෑම.

## හැඳින්වීම

ඉන්දියාවේ මෞර්ය අධිරාජයාගේ යුගයේ දී ලැබුණු අභිෂේක ක්‍රමයත් සමඟ මෙරට දේශපාලන ක්ෂේත්‍රය නවමු මඟකට යොමු විය. මෙම සිදුවීම පැරණි ලක්දිව දේශපාලන ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂය බවට පත් විය. ඉන්දියානු රාජ පදවි ප්‍රාප්ත ක්‍රමයේ සම්ප්‍රාප්තිය, පැරණි ලංකාවේ දේශපාලන හා පරිපාලන තන්ත්‍රය යන මැයෙන් සකස් වන මෙම ලිපියෙන් සාකච්ඡාවට බඳුන් වන්නේ ලක්දිව ජනාවාසකරණයෙන් අනතුරුව බිහිවූ මෙරට රාජ්‍යත්වය ලැබීමේ ක්‍රමය වෙනස් වී ක්‍රි. පූ. 3 වන සියවස වන විට ඉන්දියානු මැදිහත්වීම හරහා නව ආරක අභිෂේක ක්‍රමයක් බිහිවීම පිළිබඳව යි. ඒ හරහා දේශපාලන තන්ත්‍රයේ පමනක් නොව සාමාජීය, ආර්ථික ආදී අංශවල ද පැහැදිලි වෙනස්කම් ඇති විය.

## සාහිත්‍ය විමර්ශනය

දීපවංසය(1927) පී.ඤානානන්ද හා පී. සීලානන්ද, එම්.පී. පීරිස් ප්‍රකාශන, එගොඩ උයන, පානදුර : ද ස්ටාර් ප්‍රෙස්.

දීපවංසය යනු ඉතිහාස කරුණු අනාවරණය කර ගත හැකි දැනට පවතින පැරණිම පාලි ග්‍රන්ථයකි. මෙය විජයගේ රජවීම සඳහන් කරන ආකාරය මෙන්ම දෙවනපෑතිස් රාජ්‍ය අවධිය පිළිබඳ තොරතුරු ලබාගැනීමේදී බෙහෙවින් ඉවහල් විය. මෙහි සඳහන් 51, 54 කරුණු තහවුරු කිරීම සඳහා ලිපියට ඇතුළත් කර තිබේ.

මහාවංස(1959) බුද්ධදත්ත පොල්වත්තේ කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.කොළඹ.
මහාවංසය යනු මෙරට අඛන්ඩව ඉතිහාසය ගොඩනගාගැනීමට ඇති ප්‍රධාන ඓතිහාසික මූලාශ්‍රයයි. අනුරාධපුර යුගයේ මහාවිහාරවාසීව වැඩ විසූ මහානාම හිමියන් විසින් මෙය ලියා තිබේ. දේවානම්පියතිස්ස රාජ්‍ය අවධියේ ලංකාවට ලැබුණු දේශපාලන පරිපාලන තන්ත්‍රය කවරාකාර වූයේදැයි තොරතුරු විමර්ශනය කිරීමට පොල්වත්තේ බුද්ධවත්ත හිමි විසින් සංස්කරණය කර ඇති පාලි මහාවංසයේ 63, 64 ගාථා කරුණු උපයෝගී කොට ගෙන තිබේ.

වංසත්ථපකාසිනී හෙවත් මහාවංස ටීකාව(2001), අමරවංස හිමි අකුරටියේ, දිසානායක ප්‍රේමචන්ද්‍ර, ගුණසේන සහ සමාගම, කොළඹ.
වංසත්ථපකාසිනි යනු මහාවංස ටීකාවයි. මෙහි මෙරටට ලැබුනු අභිෂේකයේදී අනුගමනය කළ චාරිත්‍ර විධීන් පිළිබඳ දැක්වෙන දීර්ඝ විස්තරයක් විමර්ශනයට බඳුන් කර තිබේ. එහි ඒ පිළිබඳ ඇතුළත් සියලු තොරතුරු පර්යේෂණ ලිපිය සාර්ථක කරගැනීම සඳහා යොදාගෙන තිබේ.

Epigraphy Zylanica, (1928-1933) Vol. III, S. Paranavitana, Government of Ceylon by Humphrey Milford.
මෙරට ඇති සෙල්ලිපි කරුණු එකතු කොට පොතක් ලෙස සංග්‍රහ කර ඇත. Ephigraphia Zelanika Vol III, V ග්‍රන්ථ උපයෝගී කොට ගෙන ඇත්තේ විශේෂයෙන් මෙරට පරිපාලන තන්ත්‍රය තුළ ක්‍රියාත්මක වූ නිලතල පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට ය.

Inscription of Ceylon,(1970)Vol.I,Pt II, Paranavitana, Department of Archaeology,Ceylon.
මෙම ග්‍රන්ථය ද සෙල්ලිපි එකතුවකින් සංග්‍රහ කරන ලද්දක් වන අතර සෙල්ලිපි කරුණු අධ්‍යනයේදී මෙය භාවිත කරනු ලැබීය.

Archaeological Survey of Ceylon Annual Repaorts,(1934),Colombo : Department of Archaeology.
පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රකාශනයක් වන Archeological Servay of Ceylon Annual Reports නම් පුරාවිද්‍යා ලිපි එකතුවකින් යුතු වාර්ෂික සඟරාවේ පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය පිළිබඳ විද්වතුන්ගේ අදහස්, මතවාද මෙන්ම ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ පැවති තනතුරු සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන තිබේ.

ආටිගල නිකලස් සහ වෙනත් අය (1964)ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයීය ප්‍රකාශනය.

නිකලස් ආටිගල සහ විද්වතුන් පිරිසක් එකතු වී නිර්මාණය කර ඇති ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1 කොටස මෙරට ඉතිහාසය සම්බන්ධ කවර තොරතුරු අධ්‍යයනය කරන්නෙකුට වුව ද මහත් රුකුලක් සපයන්නෙකි. මෙරට ජීවත් වූ ප්‍රමුඛ පෙළේ පුරාවිද්‍යාඥයන්, ඉතිහාසඥයන් පැරණි ලංකාවේ රාජ්‍යත්වය සම්බන්ධයෙන් දක්වා ඇති තොරතුරු තනතුරු පිළිබඳ මතවාද අධ්‍යයනය කිරීමේදී මේ ග්‍රන්ථය තුළින් විශාල පිටිවහලක් ලැබුණි.

කොඩ්රින්ටන් සී.ඩබ්. (1961), සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය. විදේශිකයෙකු වන ජී.ඩබ්. කොඩ්රින්ටන් විසින් සකස් කර ඇති සංක්ෂිප්ත ලංකා ඉතිහාසය (Short Historical of Cyelon) නම් ග්‍රන්ථය තුළින් ඉන්දියාවේ ලද අභිෂේකය පිළිබඳව දක්වන වෙනස් වූ මතවාදය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමට ඉවහල් විය.

Hettiarachchi, Thilak.(1972) History of Kingship in Ceylon,Colombo 2 : Lake House Invesments Limited.
මෙරට රාජ්‍යත්වය පිළිබඳව පුළුල් ලෙස පර්යේෂණයක් කළ විද්වතෙකි, තිලක් හෙට්ටිආරච්චි මහතා. ඔහු විසින් සකස් කරන ලද History of Kingship in Ceylon ග්‍රන්ථයේ ලංකාවේ රාජ්‍යත්වය ගොඩනැගුනේ ප්‍රාදේශීය පාලනය හරහා ද නැතහොත් රජු යන තනතුර ඉන්දියාවේ අශෝක විසින් මෙරට නිර්මාණය කරන ලද්දක්ද යන්න පිළිබඳ තොරතුරු සොයාබැලීමේදී මෙන්ම ලංකාවේ රාජ්‍යත්වය හා නිල තනතුරු සම්බන්ධ අනෙකුත් තොරතුරු සොයාබැලීමේදී බොහෙවින් ඉවහල් විය.

## පර්යේෂණ ගැටලුව

පැරණි ලක්දිව දේශපාලනය, පරිපාලනය හා නිල තනතුරුවල බිහිවීම කෙසේ සිදුවී ද?

## පර්යේෂණ අරමුණු

1. විජයාගමනයෙන් පසුව ලංකාවේ බිහිවූ රාජ්‍යත්වය පිළිබඳ සොයා බැලීම.
2. දේවානම්පියතිස්ස රජු හා ඉන්දියාවේ අශෝක රජු අතර ඇතිවූ සම්බන්ධතාව පිළිබඳ සොයා බැලීම.
3. අශෝකගේ අභිෂේක ක්‍රමය පිළිබඳ සොයා බැලීම.
4. මෙරටට ලැබුණු ඉන්දියානු අභිෂේක ක්‍රමය ලංකාවේදී ආගමික, ආර්ථික, සාමාජීය අංශ ඔස්සේ වෙනස් වූ ආකාරය සොයා බැලීම.
5. පැරණි ලක්දිව දේශපාලන පරිපාලන තන්ත්‍රයේ බිහිවීම හා එහි ඉදිරි ගමන පිළිබඳ සොයා බැලීම.

## පර්යේෂණයේ වැදගත්කම

මෙම පර්යේෂණය මඟින් ලක්දිව රාජාණ්ඩුක්‍රමය බිහිවීමේ මූලික පසුබිම මෙන් ම පැරණි ලක්දිව දේශපාලන හා පරිපාලන තන්ත්‍රයේ ගමන් මග පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ මාතෘකාවේ අරමුණු සාධනය කරනු වස් පර්යේෂණ ක්‍රමවේදය ලෙස සෙල්ලිපි අධ්‍යයනය මෙන් ම ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ග්‍රන්ථයන් අධ්‍යයනය කර තිබේ.

## සාකච්ඡාව

රාජ්‍යත්වය යන්න විවිධ කෝණයන්හි සිට විමර්ශනය කරන විද්වත්හු රාජ්‍යත්ව සංකල්පයට නොයෙකුත් අර්ථකතන ලබා දෙති. ඒ අතර ඇතැමෙක් පවසන්නේ රාජ්‍යත්වය යන්න සංකේතයක් පමණක් බවයි. රාජ්‍ය දේව වරමකින් බිහිවූවක් බව පෙන්වන දේවවරම්වාදය ඈත අතීතයේ පිළිගත් මතවාදය විය. අනතුරුව රාජ්‍ය වූ කලී සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් බව බුදු දහමේ මෙන් ම 17, 18 වන සියවස් කාලයේ බිහිවූ තෝමස් හොබ්ස් (1588 - 1679) ජෝන් ලොග් (1632-1704) ජැක්වින් රූසෝ (1712-1778) වැනි චින්තකයන්ගේ මතයන් විමසා බැලීමේදී පැහැදිලි වේ. (සොයිසා 2003 : 94-150) එසේම රාජ්‍ය වූ කලී සමාජ විකාශනයක ප්‍රතිඵලයක් බවට ද තොරතුරු ඉදිරිපත් වී තිබේ. කෙසේ වෙතත් රාජ්‍යත්වය යනු ජන සම්මතවාදී ලෙස බිහි වූ තත්ත්වයක් යැයි පැහැදිලි කරගත හැකි හේතු සාධක බහුල ය. ලංකාවේ, විජයගෙන් ජනාවාස වූ සමාජය මගින් ගොඩනැගෙන රාජ්‍යත්වය තිස්ස රාජ සමය වන විට රජ පදවියට පත්වීම් සම්බන්ධව සුවිශේෂී සන්ධිස්ථානයකට පත් වේ.

ක්‍රි.පූ. 4 වන සියවසේ ඉන්දියාවේ නන්ද රාජවංසය බලයේ සිටින කාලයේදී ලංකාව සමඟ රාජදූත සම්බන්ධතා ගොඩනැගී තිබූ බව මූලාශ්‍රයමය තොරතුරුවලින් හෙළි වේ. දේවානම්පිය තිස්ස යුගය වන විට ඉන්දියාවේ මෞර්ය අශෝක අධිරාජයා හා වූ මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස ලංකාව දේශපාලන වශයෙන් ප්‍රබල ඉදිරි පියවරකට ගමන් කරනු දක්නට ලැබේ. අශෝක හරහා ලද අභිෂේක ක්‍රමය මෙරට සංවිධානාත්මක පරිපාලන රටාවක් ගොඩනැන්වීමට ඉවහල් විය. විජයගෙන් ආරම්භ වූ මෙරට පාලක පංතිය දේශපාලන සිද්ධාන්ත මත නිලබල ක්‍රමයක් සහිත ව ගොඩනැගෙන්නේ අශෝක ලංකාවේ දේශපාලනයට කරන මැදිහත්වීම හරහා ය. ඉන්දියාවේ අශෝක යුගයේදී මිහිඳු හිමි හරහා ලැබුණු බුද්දහම රාජ්‍ය ආගමක් ලෙස සකස් වී දේශපාලන සිද්ධාන්ත ශක්තිමත් කිරීම කෙරෙහි බලපෑවේ ය. ඉන්දියාවේ මගධය කේන්ද්‍ර කරගෙන ගොඩනැගී පැවති ආණ්ඩු ක්‍රමය සහ නිල තනතුරු නාම ත් අශෝක විසින් දෙවැනිපෑතිස් රජුට හඳුන්වා දෙන ලදී. වැඩි වශයෙන් ඉන්දියාවේ වයඹ, ඊසාන, නැගෙනහිර, හා දකුණු ප්‍රදේශවලින් ලද බලපෑම මෙරට ආණ්ඩුක්‍රමය සකස් වීම කෙරෙහි පසුකාලීන ව බලපෑවේ ය.

අශෝකාභිෂේක ක්‍රමය මෙරටට හඳුන්වාදීමට ප්‍රථම ද මෙරට පැවති අභිෂේක ක්‍රමය ඉන්දියාවෙන් පැමිණි ක්‍රමයක් යැයි අනුමාන කළ හැකි ය. එහෙත් එය කුමන ආකාරයේ ක්‍රමයක් වී දැයි යන්න පිළිබඳ පැහැදිලි තොරතුරු නොලැබේ. විජය රජවීම පිළිබඳ දීපවංසයේ දැක්වෙන්නේ

> "ධන ධාන්‍යයෙන් අතිශයින් සමෘද්ධ වූ අතිවිශාල වූ අතිශයින් මනෝරම්‍ය වූ යම් නගරයක් වීද රම්‍යලංකාද්වීපයෙහි එම තම්මැන්නා

> නුවර ඊශ්වර නමින් විජය නම් වූ රජ තෙමේ පළමුකොට රජය කරවීය. ඔහුගේ අභිෂේකයෙන් සත්තිස්වර්ෂයක් පැමිණි කල්හි නොයෙක් මිනිසුන්ගෙන් ගැවසීගත් දනව් සමූහයක් විද්‍යාමාන විය''(දීපවංස 1927 : 51).

යනුවෙනි. දෙවනපෑතිස් රජුට පෙර පැවති අභිෂේක ක්‍රමයේ විශේෂ ලක්‍ෂණය ලෙස දක්නට ලැබෙන්නේ ක්‍ෂත්‍රිය කුමරියක් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමයි. විජය තම අභිෂේකය පිණිස ක්‍ෂත්‍රිය කුමරියක් ගෙන්වා ගැනීමට රාජදූතයන් ඉන්දියාවට යැවීය. ඒ අනුව විජායි කුමරිය මෙරටට පැමිණි අතර පඩුවස්දෙව් රජුගේ අභිෂේකය සඳහා ද භද්දකච්ඡායනා නමින් කුමරියක් මෙරටට ගෙන්වා ගත්තේ ය. මෙලෙස විජයගේ සිට දෙවනපෑතිස්ගේ පළමු අභිෂේකය දක්වා ඉන්දියාවෙන් ලද අභිෂේක ක්‍රමයක් මෙරට පවතින්නට ඇති අතර ඒ ක්‍රමයේ විදේශීය බලපෑම් සහිත ලක්‍ෂණයන් දක්නට ලැබෙන්නේ අඩු වශයෙනි.

ලංකාවේ දෙවනපෑතිස් රාජ යුගයේ ඉන්දියාවේ අධිරාජ්‍යයා වූ අශෝක රජු සමඟ විශාල සම්බන්ධතාවක් ගොඩ නැගෙනු දක්නට ලැබේ. මෙම දේශපාලන සම්බන්ධතාව පසු කාලීන වනවිට ආගමේ මුසුවීමත් සමඟ ඉතා ප්‍රබල ඉන්දු ලංකා සම්බන්ධතාවකට යොමු වූවක් විය. මෙකල ඉන්දියාවේ අශෝක රජු වෙත මෙරටින් තුටු පඬුරු යැවූ බව වංසකතා තොරතුරුවලින් හෙළි වේ. දෙවනපෑ තිස් රජු කල, ඉන්දියාවේ අශොක අධිරාජයා වෙත දූතයින් සිවු දෙනෙක් පඬුරු සහිතව එහි යැවීය. ඒ අනුව දෙවනපෑතිස්ගේ බෑණා වූ අරිට්ඨ කුමරු ප්‍රමුඛ බ්‍රාහ්මණයා(තාලි පබ්බත)ද, ඇමතියා(මල්ල) ද තිස්ස නම් ගණක ඇමතියා ද යන අයගෙන් යුත් දූත පිරිසක් බල සෙනඟ සහිත ව සකස් කර යැවූ අතර පඬුරු වශයෙන් පහත සඳහන් දෑ එහි යැවූ බව සඳහන් වේ.

> ''ඉන්ද්‍ර නීල, වෙරළු මිණි, පද්මරාග,(මහාවංසය 1959 : 63) යන මැණික් ජාති තුන ද ලතා යෂ්ටිය, කුසුම් යෂ්ටිය හා සකුණ යෂ්ටිය යන රථ යෂ්ටි තුන ද, දක්‍ෂිණාවෘත සංඛය, අස්රූ සදිසි මුතු, ඇත් රූ සදිසි මුතු, ආමලකී (නෙල්ලි ගෙඩි) සදිසි මුතු, මුතු සදිසි මුතු, කුඹුක් පල සදිසි මුතු, පියව් මුතු වශයෙන් වූ මෙම අට ජාති මුතු යන අගනා වූ රත්නයන් ඔවුන් අතට දී ධර්මාශෝක රජු වෙත යැවී ය.'' (දීපවසංය 1927 : 54)

දින 14 ක් ගතවූ මෙම ගමන ලංකාවේ ජම්බුකෝල වරායේ සිට ඉන්දියාවේ පාඨලීපුත්‍රය දක්වා ගියේය. දින 7 කින් ඉන්දියාවේ වරායට ළගා වූ අතර එතැන් සිට ගොඩබිමින් පාඨලීපුත්‍රයට යාම සඳහා දින 7ක් ගත විය. මහාවංසයේ සඳහන් වන ආකාරයට දෙවනපෑතිස් රජුගේ පළමු අභිෂේකය නිසා පහළ වූ සියලු ආශ්වර්ය වස්තූන් ලැබීමට සුදුස්සා ලෙස අශෝක රජු යෝග්‍ය බව සිතීම නිසා ඔහුට මේ භාණ්ඩ පඬුරු ලෙස දූත පිරිස අත යැවීමට කටයුතු කර ඇති බව පෙනේ. දිපවංසයේ තොරතුරු අනුව නම් තිස්ස රජු අරිට්ඨ ඇතුළු දූත පිරිස ඉන්දියාවට යවා ඇත්තේ බුද්ධාදී රත්නත්‍රය ඉල්ලා ගැනීම පිණිස ය.(දීපවසංය 1927 : 55) අශෝක රජු මෙම දූත පිරිසෙන් ලංකාවේ අභිෂේකය ගැන විමසූ කල ඔවුන් පිළිතුරුදී ඇත්තේ විශේෂිත අභිෂේක ක්‍රමයක් නොමැති බව හා යෂ්ටියක් දරා රාජ්‍ය කරන බව ය. ඒ බව වංසත්තපකාසියේ මෙසේ දැක්වේ.

"න අඤ්ඤං අභිසේක පරිහාරං නාම අත්‍ථි, කෙවලං නව යට්ඨියා එවං කිර සො රජ්ජං කරොති" (මහාවංස ටීකාව 2001 : 225-234).

මෙලෙස පැවති අභිෂේක ක්‍රමයට නව අර්ථකතනයක් අශෝක රජු තම අභිෂේක ක්‍රමය ලබාදීම මඟින් සිදු කළේ ය. ඒ අනුව අභිෂේක පරිහාරයන් එම දූතයන්ට ලබාදෙමින් මෙසේ පවසයි.

"මෙයින් මා මිතුරු රජුගේ අභිෂේකය කරවූ යැයි' සමුද්‍රජ සංක ආදී වූ ත්‍රිවිධ ශංඛයන් ද, ගංගා නදී ජලය ද, අරුන්වන් මැටි ද, අටදෙනෙකු බැගින් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති කන්‍යාවන් ද, අටක් බැගින් වූ රන්, රිදී, ලෝකඩ, මැටි ආදියෙන් කළ කලස් ද, ක්ෂත්‍රීය කුළ අටක් හා ඇමති කුළ අටක් දැයි මෙසේ සර්වාභෂ්ටක නම් පඬුරු වෙසෙස් මෙහි එවීය. ඔහු තුමූ පිළිවෙළින් එවන ලද ඒ පඬුරු වෙසෙස් මෙහි එවීය"(මහාවංස ටීකාව 2001 : 231).

මේ භාණ්ඩ සමඟ පැමිණි මෙරට දූතයෝ අශෝක රජු විසින් කියන ලද පිළිවෙළ අනුව මෙරට අභිෂේක මංගල්‍යයක් සිදු කළහ. බුදු දහම වැළඳගන්න යැයි යන ප්‍රකාශය ද සමඟ තිස්ස රජුට තම රාජ දූතයන් හරහා මෙම නව අභිෂේකය ලැබීම නිසා එය ඉතා උනන්දුවෙන් තිස්ස රජු විසින් පිළිගත් බව පෙනේ. කෙසේ හෝ අශෝක රජු ලාංකික දූත පිරිසට පුද පඬුරු හා තනතුරු ලබා දී නැවත ලංකාවට එවීය (මහාවංස 1959 : 64). මෙම අභිෂේකය සඳහා ඉන්දියාවෙන් ලද භාණ්ඩ පිළිබඳව වංසකතාවල තොරතුරු දැක්වේ.

"ඒ අතර උතුම් වල්විදුනාව, ස්වර්ණමය නළල්පට, මඟුල් කඩුව, ශ්වේත ඡත්‍රය, රන් මිරිවැඩිසඟළ, හිස් වෙළුම, සාරපාමඞගය(හිස දවටන රන් දම්වැළ සේ), රන්කෙණ්ඩිය, නන්දියා වෘතය, රන් සිවිය, අභිෂේකාර්හ වූ ගඞ්ගෝදකය, දක්ෂිණාවෘත සංඛය, නොදෙව්නා උතුම් කෙළක් වස්ත්‍රය, රන් තලිය, මහත් අගනා ස්වර්ණාභරණය හැන්දය, අත් පිස්නා, පිළිකඩ, අනවතප්ත විලෙන් ගෙනෙන ලද ජලය, උත්තමහරි පර්වතය නොහොත් හිමවත් පර්වතයේ හටගන්නා රත් සඳුන් ය, අරුන්වන් මැටිය, නාගාභෘත වූ දිව අඳුන් ය, හිමවත හටගන්නා අරළු ය, ඉතා වටිනා අමා වැනි දිව ඔසු ය, ශුඩගි වෙරය(අමු ඉඟුරු සේ) හිමවත ස්වයංජාතව ගිරවුන් විසින් ගෙනෙන ලද සුවඳවත් වූ රත් හැල් සියයක් ය යන අශෝක රජුට පෙර පින් බලයෙන් උපන් මෙකී වස්තූන් දෙවනපෑතිස් රජු වෙත එවීය. (දීපවංස 1927 : 57/මහාවංස 1959 : 64)"

මෙලෙස ලද අභිෂේක පරිහාරයන් උපයෝගී කරගනිමින් සිදුකරන ලද නව අභිෂේකය පිළිබඳ මැඳුම් සඟියේ චූලසීහනාද සූත්‍ර සිංහල අටුවාවෙහි එන විස්තරයක් දීර්ඝ ලෙස මහාවංස ටීකාවේ විස්තර වේ. එයට අනුව

"පළමුවෙන් ම අභිෂේක ලබන රජදරුවන් විසින් ස්වර්ණමයාදි ත්‍රිවිධ ශංඛයන් ද, ගංගා නදී ජලය ද, ක්ෂත්‍රිය කන්‍යාවක් ද ලැබිය යුතු යැයි පවසා රජදරුවන්ගේ අභිෂේක විධි කියන ලදී. අභිෂේක මංගලය පිණිස අලංකෘත කොට පිළියෙල කරන ලද මණ්ඩපය තුළ ඉදිකරන

ලද උදුම්බර ශාඛා මණ්ඩපය මැද මනා කොට පිහිටුවන ලද උදුම්බර භද්‍ර පීඨයෙහි අභිෂේකාපේක්ෂක අභිජාත ක්ෂත්‍රියයා හිඳුවා, පළමුකොට මංගලාභරණයෙන් සැරසී ගත් ජාතිසම්පන්න ක්ෂත්‍රිය කන්‍යාවක් තොමෝ ගංගා නදී ජලය පිරි සමුද්‍රජ දක්ෂිණාවෘත ශංඛයක් දෙ-අතින් මනා සේ ගෙන ඔහුගේ හිසට උඩින් ඔසවා හිස් මුදුනෙහි අභිෂේක ජලය ඉසිමින් මෙසේ කියයි. 'දේවයනි, සියලු ක්ෂත්‍රීය ගණයා තමන් ආරක්ෂා කරනු වස් ඔබ මේ අභිෂේකයෙන් අභිෂේක කොට මහරජු ලෙස පත්කොට ගන්නාහ. මේ රාජ ධර්මයෙහි පිහිටා දැහැමෙන් සෙමෙන් රාජ්‍ය කරනු මැන. මේ ක්ෂත්‍රීය ගණයා වෙත පුත්‍ර ස්නේහය අනුව ගිය අනුකම්පා සහගත සිත් ඇතිව, හිත් කැමතිව, මෙත් සිත් ඇතිව පවතිනු මැන. ඔවුන් රැකවරණ යොදා ආරක්ෂා කරනු මැන'

ඉක්බිත්තෙන් පුරෝහිත තෙමේ පුරෝහිත තනතුරට අයත් වස්ත්‍රාභරණයෙන් සැරසී ගංගා නදී ජලය පිරි රජතමය ශංඛයක් දෙ-අතින් මනා සේ ගෙන ඔහුගේ හිසට උඩින් ඔසවා හිස් මුදුනෙහි අභිෂේක ජලය ඉසිමින් මෙසේ කියයි. "දේවයනි, සියලු බ්‍රහ්මණ ගණයා තමන් ආරක්ෂා කරනු පිණිස ඔබ මේ අභිෂේකයෙන් අභිෂේක කොට මහරජු ලෙස පත්කොට ගන්නාහ. රාජ ධර්මයෙහි පිහිටා දැහැමෙන් සෙමෙන් රාජ්‍ය කරනු මැන. මේ බ්‍රාහ්මණ ගණයා වෙත පුත්‍ර සෙනේහය අනුව ගිය අනුකම්පා සහගත සිත් ඇතිව, හිත කැමතිව, මෙත් සිත් ඇතිව පවතිනු මැන,

ඉක්බිත්තෙන් සිටු තෙමේ ද සිටු තනතුරට අයත් සියලු වස්ත්‍රාභරණයෙන් සැරසී ගංගා නදී ජලය පිරි රත්නමය ශංඛයක් දෙඅතින් මනා සේ ගෙන ඔහුගේ හිසට උඩින් ඔසවා හිස මුදුන්හි අභිෂේක ජලය ඉසිමින් මෙසේ කියයි. 'දේවයනි, සියලු ගෘහපති ගණයා තමන් ආරක්ෂා කරනු පිණිස ඔබ මේ අභිෂේකයෙන් අභිෂේක කොට මහ රජු ලෙස පත්කොට ගන්නාහ. රාජ ධර්මයෙහි පිහිටා දැහැමෙන් සෙමෙන් රාජ්‍ය කරනු මැන. මේ ගෘහපති ගණයා වෙත පුත්‍ර ස්නේහය අනුව ගිය අනුකම්පා සහගත සිත් ඇතිව, හිත කැමතිව, මෙත් සිත් ඇතිව පවතිනු මැන." ඔවුන්ගේ මේ ප්‍රකාශය වූ කලි "ඉදින් තොප අපගේ වචනයට අනුරූප වන පරිදි රාජ්‍ය කළහොත් යෙහෙකි. එසේ නොකළහොත් ඔබගේ හිස සත් කඩකට පැළී යේවා" යි සාප කරනු හා සම වන්නේ යයි දත යුතුයි."(මහාවංස ටීකාව 2001 : 230-231)

මේ අනුව පැහැදිලි වන්නේ ක්ෂත්‍රීය කන්‍යාව ද, බ්‍රාහ්මණ පුරෝහිතයා ද, සෙට්ඨි හෙවත් සිටු තනතුර දරූ වෙළඳ නායකයා ද රාජ අභිෂේකයේ දී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළ බවයි. තිස්ස රජුට පෙර යුගයේ අභිෂේකයකදී සිදු කළ මෙවන් වූ චාරිත්‍ර ක්‍රමයක් පැවති බවට වංසකතාගත තොරතුරු නොලැබේ. මෙම නව දේශපාලන සංස්කෘතිය හරහා ප්‍රබල බලපෑමක් ඉන්දියාවේ අශෝක විසින් සිදු කර ඇති බව පැහැදිලි වේ. එසේ ම මේ අභිෂේකයේදී ඡත්‍රයක් යට සිංහාසනාරූඪව සිටින රජතුමාගේ යහපත් පාලනය සිදුවන බවට එම ඡත්‍රයට අධිගෘහිත දේවතාවන් විසින් නිරන්තරයෙන් අවලෝකනය කරනු ලබන බව ද විශ්වාස කරනු ලැබීය. දෙවියන් විසින් ප්‍රදානය කරනු ලැබූ

අභිදානයත් සමඟ ඔහු අසහාය පුද්ගලයකු බවට පත් වේ. මෙම විශ්වාසය මහනුවර යුගය දක්වා ම පැවතුන බව විද්වත් මතයයි (සෙනවිරත්න 2003 : 234).

මෙලෙස හිංදු ආගමේ ආභාසයෙන් ගොඩනැඟුණු අභිෂේක චාරිත්‍ර උළෙල බුදු දහමේ පැමිණීමෙන් පසු එහි ආගමික ලක්‍ෂණ ත් සමඟ මුසු වනු දක්නට ලැබේ. එය මහාවංස ටීකාවේ ම සඳහන් කරුණු අනුව පැහැදිලි වේ.

> ''එතැන් පටන් මේ දිවයිනෙහි අභිෂේක ලබන රජ දරුවන්ගේ අභිෂේක මංගල්‍ය වස්තූන් බහාලීම පිණිස ගනු ලබන බඳුන් තැනීමේදී සත් තැනකින් මැටි ගත යුතු යැයි කියන ලදී. එනම්, මහබෝ ගෙහි උතුරු පියගැට පෙළට පහළින් ද, නිල් පොකුණෙහි උතුරු පියගැට පෙළට පහළින් ද, ලෝවා මහාපායෙහි උතුරු පියගැට පෙළට පහළින් ද, පගොම්ප මාලකයෙහි උතුරු පියගැට පෙළට පහළින් ද, සිවුහල්හි උතුරු එළිපතට පහළින් ද, මහ සෑයෙහි උතුරු පියගැට පෙළට පහළින් ද, භික්‍ෂූන් සිවුරු පොරවන තන්හි, සමුජ්ජ නම් ශාලාවෙහි උතුරු එළිපත පියගැට පෙළට පහළින් දැයි' යන මේ සත් තැනින් මැටි ගෙන අභිෂේක මංගල්‍ය වස්තූන් බහා ලන බඳුන් සපයා ගත යුතු යැයි....''(මහාවංස ටීකාව 2001 : 231-232).

මෙලෙස මෙරට රාජ්‍යත්වයට පත්වීම යන්න නවමු තත්ත්වයකින් ඉදිරියට, ගමන් කරනු දක්නට ලැබේ.

මහාවංස ටීකාවට අනුව දෙවන පෑතිස් රජුගේ අභිෂේකයේදී බ්‍රාහ්මණ, ජටිල, ශ්‍රමණ ආදී ආගමික නිකායවල නියෝජිතයන් සහභාගි වී රජුගේ හිසට ජලය වත්කරමින් රජු ධාර්මික විය යුතු බව ත්, තම වර්ගයා ආරක්‍ෂා කළ යුතු බවත් සඳහන් කිරීම මඟින් පැහැදිලි වන්නේ ලක්දිව රාජාභිෂේක ක්‍රමය අතීතයේ සිට ම ආගම සමඟ බද්ධ වී පැවති බවයි. බුදු දහම ලැබීමත් සමඟ අනෙකුත් ආගම් පරයමින් රාජ අභිෂේකය සම්බන්ධ සියලු වතාවත් මෙන් ම ඉන් පසු රජුගේ ක්‍රියාකාරකම් බහුතරයකට බුදු දහමේ බලපෑම ලැබී තිබේ. එනම්, ධාර්මිකත්වය යන්න මෙම ඉන්දියානු අභිෂේක ක්‍රමවේදයත් සමඟ ලක්දිවට ලැබී තිබේ. අශෝක රජුගෙන් ලංකා රජුට බුදු දහම සරණ යන ලෙස උපදෙස් ලැබුණි. මේ අභිෂේක ක්‍රමය භාර ගැනීමට පෙළඹවූයේ ලක්දිව එතෙක් පැවති අභිෂේක ක්‍රමය යෝග්‍ය නොවූ නිසා නැතහොත් ඉන්දියාවේ ආධිපත්‍ය පිළිගැනීමට ලක්දිවට සිදු වී තිබීම නිසා විය යුතු ය. මේ හරහා ලංකාවේ රාජ්‍යත්වය තරමක ඉන්දියානුකරණවීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙකල ඉන්දියාවේ දේශපාලනය ප්‍රබල තත්ත්වයක පැවති බව පැහැදිලි වේ. ලක්දිව මේ වනවිට පැවතියේ පිය පුතු සම්බන්ධතාව අනුව රජකම හිමිවන ක්‍රමයකි. අශෝකගේ අභිෂේක පරිහාරයන් ලැබීමත් සමඟ මෙරට පැවති අභිෂේක ක්‍රමය ප්‍රබල වෙනස්වීමකට බඳුන් විය. රාජ්‍යත්වය යන්න විධිමත් බවකට පත් විය. එපමණක් නොව ''දෙවන පිය'' යන විරුද නාමය භාවිත කිරීමෙන් පෙනෙන්නේ ''දෙවියන්ට ප්‍රිය'' වූ බවයි. මේ අභිෂේක චාරිත්‍රය හරහා රජු එක්තරා ආකාරයකට ආගමික බලපෑමකට හසුව තිබෙන බව ද පැහැදිලි වේ.

මෞර්ය අභිෂේක ක්‍රමය මෙරටට හඳුන්වාදීම හා අශෝක අධිරාජයා විසින් ම පත්කොට එවූ ඇමති මණ්ඩලය හරහා රාජ්‍ය පාලනය වඩා විධිමත් වීමත් සමඟ තර වූ ඉන්දු ලංකා සම්බන්ධතාව නිසා විටින් විට දෙරට අතර තව තවත් සම්බන්ධතා සවි වීමට පසුබිම සැකසුණි. දූත ගමන් ගොඩනැඟුණි. අනුරාධපුර මුල් යුගයේ මෙම ගමන් ආගමික මුහුණුවරක් ගනු දක්නට ලැබෙන අතර පසුකාලීනව දේශපාලන සම්බන්ධතා ද තවත් වැඩි දියුණු වනු දක්නට ලැබේ. එකී අභිෂේකයෙන් වැඩි කල් යාමට පෙර මිහිඳු හිමියන් ඇතුළු පිරිස මෙරටට වැඩම වූ අතර ඉන් අනතුරුව සංඝමිත්තා මෙහෙණින් වහන්සේ දඹකොළ පටුන තොටුපලින් ලක්දිවට වැඩම වූ සේක.

දේශපාලනික දායාදයන් විශාල ප්‍රමාණයක් ඉන්දියාවත් සමඟ සම්බන්ධතා පැවැත්වීම හරහා ලංකාවට ලැබී තිබේ. මේ අභිෂේකය සමඟ ලද 'දේවානම්පිය' යන විරුදනාමය ඉන්පසුව වසර 30ක් පමණ කාලයක් ලක්දිව රජ කළ රජවරුන් විසින් යොදාගෙන තිබෙන බව සෙල්ලිපිවලින් හෙළි වේ. (e.z. vol.III, 1928-1933 : 155-156) එහෙත් මහාවංසයට අනුව (මහාවංස 1959 : 63) මෙම ''දෙවන පිය'' යන නාමය තිස්ස රජුගේ දෙවන අභිෂේකයට ප්‍රථමයෙන් ද භාවිත කර ඇති බවට අනුවමාන කළ හැකිය. දීපවංසකරු තිස්ස රජුට පසුකාලීනව යෙදුණු ''දෙවන පිය'' යන නාමය සමඟ තිස්ස යන නම එකට ගලපා ගනිමින් තිස්ස රජුගේ දෙවන අභිෂේකයට පෙර ම ඒ නම යොදාගෙන තිබේ. කෙසේ වෙතත් දීපවංසකරු එකොළොස්වන පරිච්ඡේදයේ හතළිස්වන ගාථාවෙන් තිස්ස රජුගේ දෙවන අභිෂේකය සිදු වූ බව පිළිගනී. මෙහිදී ද සඳහන් වී ඇත්තේ තිස්ස රජු ''දේවානම්පිය තිස්ස'' නමින්ම ය. රජු දෙවියෙක් හා සමාන විය යුතු ය යැයි පැරණි භාරතයේ තුළ පැවති සංකල්පය ලක්දිවට ලැබිණි. මේ අනුව පැහැදිලි වන්නේ ලක්දිවට ලැබුණු ඉන්දියානු දේශපාලන සිද්ධාන්ත ආගමික මතිමතාන්තර ද සමඟ මුසුවෙමින් ලක්දිවට ලැබුණු බවයි. පසුකාලීන වන විට මෙලෙස රජු දෙවියෙක් විය යුතු ය යන සිද්ධාන්තය වර්ධනය වී මහායාන ඉගැන්වීම් සමඟ මුසුවී රජු බෝධිසත්වයකුගේ තත්වයට පත්විය යුතුය යන සංකල්පය ඉස්මතු වූ බව පෙනේ.

සමාජයක ප්‍රගමනයේ පැතිකඩයන් වන ආර්ථික, සමාජීය, සංස්කෘතික සියලු පාර්ශ්වයන්හි දියුණුව පිණිස රාජ්‍යයක අවශ්‍යතාව ලාංකිකයන්ට අවබෝධ විය. ඒ අනුව විජයගේ පැමිණීමෙන් පසුව ක්‍රමයෙන් පාලන ක්‍රමයක් ගොඩනැගුණේය. 'ගාමිණී', 'මපුරුමුඛ' ආදි නාමයන් හරහා ප්‍රාදේශීය වශයෙන් පැවති පාලනය ක්‍රමයෙන් වර්ධනය වී රාජ්‍යත්වය කරා ළගා වූ බව විද්වතුන්ගේ මතයයි. එහෙත් පැරණි කාලයේ සිට මෙරට රාජාණ්ඩු ක්‍රමයක් දක්නට තිබුණි. අශෝකාභිෂේක ක්‍රමය මෙරටට ලැබීමට ප්‍රථමයෙන් දේශීය පාලන ක්‍රමයක් පැවතුණ බවට සිතිය හැකි වුව ද රාජ්‍යයත්වය යන්න සකස් වූයේ ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයාගෙන් ලැබුණු අභිෂේක ක්‍රමයට අනුව මෙරට රාජ්‍ය අභිෂේකය සිදුවීමෙන් පසුව ය. උත්තිය රජු ''මහරජ'' යන විරුදය භාවිත කර ඇති බව මිහින්තලේ බ්‍රාහ්මීය සෙල් ලිපියකින් තහවුරු වේ.(e.z,vol 5,1966 : 231) උත්තිය රජුට පෙර එම පදවිය දැරූ දෙවනපෑතිස් රජු ද 'මහරජ' යන නමින් හඳුන්වාදී ඇත.(I.C.Vol.I,1970: xliv–xlvii) සම්මෝහවිනෝදිනිය හා සුමංගල විලාසිනියේ 'රජ' යන වචනය අර්ථ දක්වා ඇත්තේ අභිෂේක කළ පුද්ගලයා යනුවෙනි. රජු

කේන්ද්‍ර කරගත් රාජාණ්ඩු ක්‍රමයේ පාලන සංවිධානයක් ක්‍රමයෙන් මෙරට ගොඩනැගුණි.

ඉන්දියාවෙන් මෙරටට ලද අභිෂේක ක්‍රමය පිළිබඳ විද්වත්හු නොයෙක් මත පළකරති. "Inscription of Ceylon" නම් ග්‍රන්ථයේ 'ගාමිණි' යන විරුදය පිළිබඳ අර්ථ විවරණය කරන තැනදී සෙනරත් පරණවිතානයන් පෙන්වා දෙන්නේ පුරාණ ලංකාවේ දේවානම්පියතිස්ස රජුට පෙර අභිෂේක ක්‍රමයක් නොවූ බවයි. ඔහු සඳහන් කරන්නේ අභිෂේක ක්‍රමය ලැබීමට පෙර මහජනයා විසින් තෝරා පත්කරනු ලැබූ පාලකයින් විධායක ධූරයට පත් වූ අතර දේවානම්පිය තිස්සගේ අභිෂේකයට පසුව රාජ්‍යත්වය ස්ථාපිත වූ බවයි. අශෝක අධිරාජ්‍යයාගෙන් මෙරටට ලද අභිෂේකය පිළිබඳ අදහස් දක්වන තිලක් හෙට්ටිආරච්චි පවසන්නේ "අශෝකගේ අනුග්‍රහයෙන් පවත්වන ලද අභිෂේකයෙන් ලංකාවේ ප්‍රාදේශීය නායකත්වය රාජ්‍යයත්වය බවට" පරිවර්තනය වූ බවයි(Hettiarachchi 1972 : 24-33)'ගාමිණිවරු'පසු කලෙක රජ හා මහරජ තත්වයට පත්වන්නට ඇති බවට තොරතුරු හෙළි වේ.

අභිෂේකය ලබාගැනීමට පෙර තිස්ස රජු විසින් ඉන්දියාවට යවන ලද දූත පිරිස අත අශෝක රජු වෙත නොයෙකුත් තෑගි යැවූ බව යථෝක්තව දක්වන ලදී. මේ පිළිබඳ අදහස් දක්වන විද්වත්හු මත පළ කරති. සී.ඩබ්.කොඩ්රින්ටන් මහතා පෙන්වා දෙන්නේ අශෝක ඉන්දියාවේ ලබා සිටි බලසම්පන්න තත්වය නිසා තිස්ස රජු තම ආධිපත්‍ය තහවුරු කර ගැනීම සඳහා එවැනි අභිෂේකයක් ඉල්ලුවා විය හැකි බවයි(කොඩ්රින්ටන් 1961 : 12-16). ඇම්.හොර්කාර්ට් මහතාගේ අදහස වන්නේ රජ පවුල්වල ඥාති සම්බන්ධකම් නිසා තිස්ස මෙසේ කරන්නට ඇති බවයි(පරණවිතාන සහ තවත් අය, 1967 : 122). සෙනරත් පරණවිතාන මහතාගේ අදහස නම් අශෝක අධිරාජයාගේ රාජකීය විරුදාවලි හා සම්මාන සහිතව රාජ පදවිය තමා කෙරෙහි පවරණ මෙන් අයද සිටීම මේ දූත පිරිසේ අරමුණ වූ බවයි(පරණවිතාන සහ තවත් අය, 1967 : 122). තිස්ස රජු අශෝක රජුට වඩා බලයෙන් හා ආඪ්‍යයෙන් පහළ මට්ටමක සිටි නිසා තම යටහත්පහත් බව පෙන්වීම පිණිස මෙරට රජු මෙලෙස තෑගි බෝග, පුද පඬුරු රැගත් දූතයින් ඉන්දියාවට යැවූ බව සිතිය හැකි අතර මෙම සිද්ධිය ලක්දිව පාලකයා තුළ පැවති පරිත්‍යාගය මුල්කරගත් රාජ්‍යපාලන ක්‍රමය නිසා සිදුවූවක් ලෙස ද උපකල්පනය කළ හැකි ය. මෙහිදී සැලකිල්ලට බඳුන් විය යුතු කරුණ නම් සමාන තත්වයේ සිටි තුඩුටු මිතුරන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු තෑගි බෝග යැවූ විට ඊට ප්‍රතිඋපකාර පිණිස අනෙකා රාජාභිෂේක ක්‍රමයක් එවීම සහ ඔහු පිළිගත් ආගම වැළඳගන්නා ලෙස සඳහන් කර දූතයන් එවීමයි. ලංකාවෙන් අශෝක රජු වෙත ගිය දූතයන්ට උසස් තනතුරු දීමෙන් වැදගත් කරුණු දෙකක් හෙළි වේ. එනම්,

1. වංසකතාකරුවන් කුමක් පැවසුව ද තිස්ස රජු අශෝක අධිරාජ්‍යයා සමඟ සමානත්වයක් නොපැවති බව සහ
2. ලංකාවේ රාජ්‍යත්වය ඉතා නොදියුණු මට්ටමක තිබූ බවයි.

කෙසේ හෝ මෙම අභිෂේක ක්‍රමය ලැබීම හරහා උසස් තනතුරු සහිත ව ඉන්දියානු ක්‍රමයට (මොඩලයට) සකස් කළ රාජ සභාවක් මෙරට ගොඩනැගුණු

අතර තිස්ස රජුගේ අභිෂේකය සිදුකළේ මෙම විධිමත් ව පත් වූ නිලධාරීන් විසිනි.

ශක්තිමත් දේශපාලන ක්‍රමවේදයක අවශ්‍යතාවක් තිස්ස රජුට වූ නිසා අශෝක රජු වෙත තෑගි බෝග, පුද පඬුරු යවා එය ගෙන්වා ගන්නට කටයුතු කරන්නට ඇත. මේ කාලවකවානුවේ ලංකාවේ 'රජ' නමින් හැඳින්වූ ප්‍රාදේශීය පාලකයන් ගණනාවක් සිටි නිසා මොවුන් අතරින් ප්‍රබලයකු වන්නට තිස්ස රජුට අවශ්‍ය වූ නිසා ඔහු ඒ සඳහා ඉන්දියාවත් සමඟ විදේශ සම්බන්ධතා වර්ධනය කරගෙන මෙම අභිෂේක ක්‍රමය ලබාගන්නට ඇතැයි කල්පනා කළ හැකි ය. තිස්ස රජු තම සහෝදර සහෝදරියන්ගෙන් ද පැවති තර්ජන ද මේ සඳහා තවත් හේතුවක් වූ බව පැහැදිලි වේ. කෙසේ හෝ මේ කරුණු අනුව පැහැදිලි වන්නේ තිස්ස රජු අශෝක රාජ්‍යයට වඩා අඩු බලයක් සහිත පුද්ගලයෙකු ව සිටි බවයි. මහාවංස ටීකාවේ තොරතුරුවලට ද අනුව පැහැදිලි වන්නේ ලංකාවේ පැවති ප්‍රාථමික අභිෂේක ක්‍රමය වෙනුවට විදිමත් අභිෂේක ක්‍රමයක් ලබාදිමට අශෝක රජු කටයුතු කර ඇති බවයි. මෙම නව රාජ්‍යත්වයේ ක්‍රමය ලබාදීම හරහා සටන් කිරීමකින් තොර ව මෙරට ඉන්දියානු දේශපාලන ආධිපත්‍යයට යටත් කිරීමට අශෝක රජු ක්‍රියා කළ බව පෙනේ. අතීතයේ බලවත් රජවරුන්ට ගරු කිරීමේ ක්‍රමයන්ගෙන් එකක් වූ භුක්තිශතකයාවක නැතහොත් රාජ්‍යයේ ගැරුඩ මුද්‍රාව(රාජ්‍ය නිල ලාංඡනය)පිළිගැනීමෙන් ලක්දිව තිස්ස රජු ක්‍රියා කරන්නට ඇතැයි සිතිය හැකි ය.

සමන්තපාසාදිකාවේ තිස්ස රජු කළේ එක් අභිෂේකයක් පමණක් බව සඳහන් කරන අතර එය අශෝකගෙන් ලද අභිෂේකය බව සඳහන් කරයි(සමන්තපාසාදිකා 2003 : 64). අශෝකගේ මෙම අභිෂේකය සමඟ භාරතයේ දියුණුවට පත් වූ රාජ්‍යත්වය සම්බන්ධ විවිධ අදහස් ලංකාවට ලැබුණු බව පෙනේ. මේ අභිෂේක ලබාගැනීම හරහා පාරම්පරික උරුමයෙන් රාජ්‍ය හිමිවන රාජවංස ක්‍රමයක් ආරම්භ විය. ධාතුසේන රාජ්‍ය කාලය වන විට සිංහාසනයට උරුමකම් කිවහැක්කේ අභිෂේක කළ රජකුගේ පුතකුට පමණක් බව පිළිගැනීම විය. මෙලෙස ලද අභිෂේක උත්සවය සම්බන්ධව තවත් චාරිත්‍ර විධි සහිත උත්සව ඇතිවීම හේතුකොට ගෙන රජුගේ පරමාධිපත්‍ය වර්ධනය විය.

මෙලෙස අශෝක රජු විසින් නව දේශපාලන ක්‍රමයක් හඳුන්වාදීම හරහා ලක්දිව විශාල විපර්යාසයක් සිදුවිය. දේශපාලනික වශයෙන් රජුගේ තත්ත්වය, කාර්ය භාරය පමණක් නොව රජුගේ සිට පහළට පැවත එන නව රාජ්‍ය තනතුරු ගණනාවක් බිහිවිය. පැවති තනතුරුවලට නව කාර්යභාරයන් අයත් විය. දෙවනපෑතිස් රජු මෙරටින් දූතයන් අශෝක රජු වෙත යවන අවස්ථාවේදි ඔවුන් නිල තනතුරු කිහිපයක් දැරීය. මෙරටින් ගිය පිරිසට ලබාදුන් තනතුරු අතර බමුණාට පුරෝහිත තනතුර ද, ඇමතිට දණ්ඩනායක තනතුර ද, ගණකයාට සිටු තනතුර ද, අරිට්ට කුමරුට සේනාපති තනතුර ද, ලබා දුන්නේ ය. ඒ බව මහාවංසයේ මෙසේ සඳහන් වේ.

"පොරෝහිච්චං බ්‍රමණස්ස දණ්ඩනායකතම්පන
අදාසි තස්සමච්චස්ස සෙට්ඨිතතං ගණකස්ස තු"

(මහාවංසය 1959 : 63)

ඒ අතර අමාත්‍යයා, ගණකයා, ආදීහු වූහ. අශෝක රජු විසින් මෙම පිරිසට තනතුරු හා උපාධි නාම ලබාදුන් අතර අශෝක රජු ඔවුන් මෙරටට එවීය. දේවානම්පිය තිස්සගේ අභිෂේකය ද සිදුවූයේ මෙම නිළධාරී මණ්ඩලයේ සහභාගීත්වයෙනි. මෙහිදී පැහැදිලි වන කරුණක් වන්නේ රජු සඳහා ප්‍රධාන ඇමතිවරුන් පත්කරගත යුතු යැයි කෞටිල්‍ය වැනි ආචාර්යවරුන් පෙන්වා දුන් (සභය සාද්‍යම් රාජත්වම්) සිද්ධාන්තයන් මූලික කරගත් ක්‍රමවේදයක් හරහා අශෝක රජු ලක්දිව දේශපාලනය සකස් කිරීම සඳහා බලපෑමක් වී ඇති බවයි. දේශපාලන ක්ෂේත්‍රයට ආගමික අදහස් මුසුවීම බුදුදහම ලැබීම ත් සමඟ වර්ධනය වනු දක්නට ලැබේ.

රාජ්‍ය පාලන කාර්යය භාරය පහසුවීම සඳහා ඇතිකරන ලද නිලධාරීන් අතර රජුට උපදෙස් ලබාදුන් පුරෝහිත තනතුර හරහා කාර්ය භාරයක් ඉටු විය. විජය කුමරු මෙරටට පැමිණෙන අවස්ථාවේදී ඔවුන් සමඟ වූ උපතිස්ස යනු බමුණෙකි. ඔහු විජයට අනුශාසනා ලබාදුන් පුද්ගලයෙකු ලෙස සැලකිය හැකි ය. පණ්ඩුකාභය සතුව පණ්ඩුල බ්‍රාහ්මණයා විය. දෙවනපෑතිස් කල කළ අභිෂේක කාර්යයේදී බමුණා විසින් විශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලැබී ය. අභිෂේක උත්සවයට අමතර ව මහජන උත්සවවලදී සම්ප්‍රදානුකූල ව මාලිගාවේ පැවැත්විය යුතු චාරිත්‍ර වාරිත්‍ර සඳහා බ්‍රාහ්මණ පුරෝහිතයන් මැදිහත්වීම අවශ්‍ය විය. බොහෝ විට ඔහු අධිකරණ විනිශ්චකරුවෙකු ලෙස කටයුතු කර ඇත. ඉන්දියාවේ අධිකරණ ක්‍රියාදාමයන්හි දී පුරෝහිතයා සතුව පැවති බලතල ලක්දිවට පුරෝහිත තනතුර ලැබීමෙන් පසු ඔහු සතුව ද ක්‍රියාත්මක වූ බව පෙනේ. මෙම පුරෝහිත තනතුරේ කාර්ය භාරය බුදු දහමේ ලංකා සම්ප්‍රාප්තියෙන් පසු බමුණන් අතින් ගිලිහී සිංහල බෞද්ධ භික්ෂූන් වටා ගොණුවනු දක්නට ලැබේ. රාජ්‍ය පාලනයේදී රජුට මෙන් ම රජයේ පැවැත්ම පිණිස ද අනුශාසකයන් වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ය. ඉන් පසු රජුගෙන් ආගම උදෙසා ත් බුදු දහමේ නියෝජිතයන් වූ භික්ෂූන් වහන්සේලාගෙන් රජු උදෙසා ත් සිදුවිය යුතු යුතුකම් හා වගකීම් සකස් විය.

රජුගේ ආරක්ෂක කටයුතු සහ රාජ්‍යයේ ආරක්ෂාව සඳහා සිටි යුධහමුදාවේ නායකයා හෙවත් සේනාධිපති තවත් වැදගත් තනතුරක් විය. බ්‍රාහ්මීය සෙල්ලිපිවලට අනුව බොහෝවිට මේ තනතුර සඳහා තෝරාගෙන ඇත්තේ කුලීන (රදළ) පවුල්වලින් බවට තොරතුරු ලැබේ(A.S.C.A.R, 1934 : 18). බොහෝවිට මේ තනතුරු සඳහා රජුගේ ඥාතියෙකු පත්විය. සමහර අවස්ථාවන්හි සේනාධිපති විසින් යුධ හමුදා ශක්තිය උපයෝගී කරගෙන රජු සිහසුනෙන් නෙරපා දැමූ අවස්ථා ද වෙයි. බල්ලාටනාග රජු කල මහාරත්ත විසින් සිහසුන ලබාගැනීම නිදසුන් ලෙස පෙන්වා දිය හැකි ය(මහාවංසය 1959 : 176). සේනාධිපතියා මූලිකත්වය ලබාදුන් 'යුධ හමුදාව' ඇත්, අස්, රිය, පාබල යන සිවුරඟ සේනාවෙන් සැදුම් ලද්දක් විය.

''බඩගරික'' යනු රජයේ භාණ්ඩාගාරය භාරව සිටි පුද්ගලයායි. පැරණි සෙල්ලිපිවලට අනුව භාණ්ඩාගාරිකයන් කිහිපදෙනෙක් ''පරුමක'' නැමති කුලීන කුලයට අයත් වූ අතර අනෙක් භාණ්ඩාගාරිකවරු ගමිකයෝ වූහ. රජුගේ භාණ්ඩාගාරිකයා පමණක් නොව පළාත් පාලන මණ්ඩලවල භාණ්ඩාගාරිකයන් ද සිටි බව පැරණි ලියකියවිලිවල සඳහන් වේ(ආටිගල සහ තවත් අය 1964 :

225). සමහර අවස්ථාවල රජුට විරුද්ධව අනුගාමිකයන් කොටසක් ගොඩනගා ගැනීමට පවා හැකියාවක් ලබාගත හැකි අවස්ථා ද ලංකා ඉතිහාසයේ දක්නට ලැබේ.

අශෝක පාලනයේදි ඔහු විසින් යොදාගත් තනතුරක් වන මහාමාත්‍රාවරු ලංකාවේ ද සිටි බව පෙනේ. සෙල්ලිපිවල මේ පදවිය දූරූ උසස් නිලධාරීන් හඳුන්වා ඇත්තේ 'මහමත' යනුවෙනි.

> "මහමත බමදත පුත පුරුමක පුසගුතන කරිතේ බඩ තුබ"(I.C. Vol. 1,1970 :21)
> "ලෙනේ සගස මහමත තිසහ ලෙනේ සගස" (I.C. Vol. 1,1970 : 53)

අධිකරණය භාරව සිටි 'මහාමන්තයෙකු' ගැන විනය පිටකයේ සඳහන් වේ(ආටිගල සහ තවත් අය 1964: 226). 'ගණක' යන තනතුර සඳහා 'සෙට්ඨි' යන උපාධිනාමය අශෝක රජු විසින් ලබා දෙන ලදී. ඒ අනුව ගණකයා නැතහොත් 'ගණකාධිකාරී' තනතුර රාජ්‍ය පාලනයේදි වැදගත් තනතුරක් විය. ගණකයින් කිහිපදෙනෙක් සිටි බවට තොරතුරු ලැබේ. පළමුවන ගජබාහු රජුගේ කාලයට අයත් සෙල්ලිපියක 'නගර ගණකයෙකු' ගැන සඳහන් වේ(e.z.vol.III,1928-1933 : 116 - 119). දෙවනපෑතිස් රජුගේ ගණකයාට අශෝක රජු විසින් පිරිනමන ලද උපාධිය වනාහි බැංකුවක හෝ වෙළඳ ශ්‍රේණියක හෝ ප්‍රධානියෙකුට විශේෂ වූ උපාධිනාමයක් විය(ආටිගල සහ තවත් අය 1964 : 226). මීට අමතර ව 'අදෙක' නමින් හැඳින් වූ අධ්‍යක්ෂක තනතුර දැරූවෙකු පිළිබඳව සෙල්ලිපිවල සඳහන් වේ. සිවිකාඅදෙක (සිවිකා අධ්‍යක්ෂ), රූපඅදෙක (රූපාධ්‍යක්ෂ), අස්අදෙක(අශ්වාධ්‍යක්ෂ) යන තනතුරු පිළිබඳ ව සෙල් ලිපිවලින් හෙළි වේ. කුරුණෑගල දිස්ත්‍රිකයේ කුඹුරුලෙන සෙල්ලිපියේ සිවිකා අධ්‍යක්ෂකවරයෙක් පිළිබඳව සඳහන් වේ.

> "මහරජස ගාමිණී-අබයස සිවිකා-අදෙක පරුමක-මජිමස ලෙනේ අගත අනගත චතුදිසසගස" (I.C. Vol.1,1970 : 69)

අශ්වාධ්‍යක්ෂ තනතුර පිළිබඳ පෙරියපුලියන්කුලමෙන් ලැබුණු ලිපියකින් තොරතුරු හමුවේ.

> "පරුමක අස දෙක වෙලුස ජය තිසය ලෙනෙ" (I.C. Vol.1,1970 : 28)

මීට අමතර ව දෝවාරික(දොරටුපල්ලා), නගරගුත්තික(නගරය ආරක්ෂාකරන්නා), අමාත්‍ය(ඇමතිවරු) රටික, ගමික නමින් හැඳින් වූ රජුගේ සිට පහළ ක්ෂේත්‍රය දක්වා ගලාගිය නිළධාරීන් ගණනාවක් ලක්දිව දේශපාලන ක්‍රමය තුළ ක්‍රමයෙන් ගොඩනැගුණේ ය. මේ තනතුරු සහිත දේශපාලන ක්‍රමවේදය සකස්වීමට ප්‍රබල ලෙස බලපෑවේ ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයා ලංකා දේශපාලනයට කළ මැදිහත්වීමයි.

සියලු මූලාශ්‍රයමය සාධක සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ දේවානම්පියතිස්ස රජු සමයේ ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ අනුග්‍රහය හරහා ගොඩනැගුණු මෙරට රජ පදවිය ලැබීමේ ක්‍රමවේදය හා දේශපාලනික තනතුරු හා ඒ ආශ්‍රිතව ගොඩනැගුණු පරිපාලන රටාව පැරණි ලක්දිව දේශපාලන ගමන් මග නව දිසාවකට යොමු කළ බවයි.

## නිගමනය

සියලු මූලාශ්‍රයමය සාධක සලකා බැලීමේදී පැහැදිලි වන්නේ දේවානම්පියතිස්ස රජ සමයේ ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ අනුග්‍රහය හරහා ගොඩනැඟුණු මෙරට රජ පදවිය ලැබීමේ ක්‍රමවේදය හා දේශපාලනික තනතුරු හා ඒ ආශ්‍රිත ව ගොඩනැඟුණු පරිපාලන රටාව පැරණි ලක්දිව දේශපාලන ගමන් මග නව දිසාවකට යොමු කළ බවයි. එසේ ම යුරෝපීයයන් මෙරටට පැමිණ දේශපාලන ක්‍රමවේදය වෙනස් කරන තුරුම මෙරට ක්‍රියාත්මක වූයේ දෙවනපෑතිස් රජුගේ යුගයේ ඉන්දියාවෙන් ලද අභිෂේකයෙන් පසු ආරම්භ වූ දේශපාලන පරිපාලන ක්‍රමවේදයේ ස්වදේශීය මුහුණුවරයි. එය එක් එක් රාජධානි යුගයන්හි යම් යම් වෙනස්කම්වලට බඳුන් වෙමින් ඉදිරියට ගමන් කර තිබේ.

## පරිශීලිත මූලාශ්‍රය


ආටිගල නිකලස් සහ වෙනත් අය (1964) *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*, පළමු කාණ්ඩය, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයීය ප්‍රකාශනය.

ඉලංගසිංහ, මංගල(2007) *සවිස්තර මහාවංස අනුවාදය*, ප්‍රථම කොටස, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කොඩ්රින්ටන්, සී.ඩබ්. (1961), *සංක්ෂිප්ත ලංකා ඉතිහාසය*, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

*දීපවංසය*(1927) පී.ඤාණානන්ද හා පී. සීලානන්ද, එම්.පී. පීරිස් ප්‍රකාශන එගොඩ උයන, පානදුර, ද ස්ටාර් ප්‍රෙස්.

ධම්මකුසල, අම්බලන්ගොඩ, *සමන්තපාසාදිකා විනයට්ඨකථා* (සිංහල පරිවර්තනය), 1 කොටස, කොළඹ, රාජකීය ආසියාතික සංගමය.

*මහාවංස*(1959) බුද්ධදත්ත, පොල්වත්තේ, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සෙනවිරත්න, අනුරාධ (2003), *ලක්දිව බුදු සසුන සහ සිංහල සංස්කෘතිය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*Archaeological Survey of Ceylon Annual Repaorts*, (1934), Colombo, Department of Archaeology.

*Epigraphy Zylanica,* (1928-1933) Vol. III, S. Paranavitana, Government of Ceylon by Humphrey Milford.

Hettiarachchi, Thilak.(1972) *History of Kingship in Ceylon*,Colombo 2, Lake House Invesments Limited.

*Inscription of Ceylon*,(1970)Vol.I;Pt II, Paranavitana, Department of Archaeology,Ceylon.